සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

மேல் மாகாண அரசாங்க சேவை ஆணைக்குழு / Provincial Public Service Commission (WP)

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම්

විභාගය - 2022

| පැය දෙකයි | මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | විභාග අංකය | |
|---|---|---|---|

- පිළිතුරු ලිවීමට පෙර ලබා දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
- විභාග අංකය ඉහත කොටුවේ හා පිළිතුරු ලියන සෑම පිටුවකම දෙපසම ඉතා පැහැදිලිව ලියන්න.
- ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- ලබාදී ඇති උපදෙස්වලට අනුකූල නොවන පිළිතුරු ඇගයීම් කාර්යය සඳහා යොදා ගනු නොලැබේ.

I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේම ද II කොටස සඳහා සපයනු ලබන කඩදාසිවලද පිළිතුරු සපයන්න. I හා II කොටස් එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.

www.psc.wp.gov.lk

I කොටස

01. ශ්‍රී ලංකා ජනරජයේ මුදල් වර්ෂය වන්නේ ................................. සිට ......................................... දක්වාය.

02. රාජ්‍ය මූල්‍යය පිළිබඳ පූර්ණ පාලන බලතල ........................................................................................ සතු වේ.

03. ................................................................... අත්සන් කරන ලද බලපත්‍රයකින් හැර ඒකාබද්ධ අරමුදලින් කිසිම මුදලක් ඉවත් කර ගත නොහැක.

04 .වාර්ෂික ආදායම් ඇස්තමේන්තු.................... විසින් සකස්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මගින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය.

05. මු.රෙ.71 යටතේ නව තනතුරු ඇතිකිරීම සඳහා ...................................... ගේ පූර්ව අධිකාරී බලය අවශ්‍ය වේ.

06. හානි සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාව හානිය සිදුවූ දින සිට ............................ක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය.

07. අධිභාර සම්බන්ධයෙන් වාරික 60ක් නොඉක්මවා අයකර ගැනීමට ................................................... ට බලය ඇත.

08. රජයට ලැබෙන ලැබීමක් වෙනුවෙන් ........................................................... ආකෘති පත්‍රයේ ලදුපතක් නිකුත් කළ යුතුය.

09. ...................................... ගෙවීම් සඳහා සෑම වවුචරයක්ම නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතුය.

10. නිලධාරියෙකු හට ජීවත්වන බවට සහතිකයක් අවශ්‍ය කල්හි අදාල නිලධාරියා ජීවත්ව සිටින බව දන්නේ නම්,එකී සහතිකය නොසලකා ගෙවීම් කිරීමට ............................................................................... ට බලය ඇත.

(ලකුණු 20 යි)

## II කොටස

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1.(i) ආදායම් ප්‍රතිග්‍රහණය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීමේදී වියදම සම්බන්ධයෙන් පවරා දීමේ අවස්ථා පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 04)

(iii) ගෙවීම් කිරීමට බලයලත් නිලධාරියෙකු විසින් වගකීමට බැඳෙන කරුණු **හයක්** සඳහන් කරන්න.

(ලකුණු 12)

2.(i) වාර්ෂික විසර්ජන පනත නීතිගත වීමෙන් පසු මුදල් ඇමතිවරයා විසින් නිකුත් කරනු ලබන වොරන්ට් බලපත්‍ර වර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට සිදුවන්නේ කුමන අවස්ථාවලදීද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(iii) අවිනිශ්චිත අවස්ථා අරමුදලින් අත්තිකාරම් මුදලක් ලබාගැනීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවල දැක්වෙන විධි විධාන මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

3.(i) ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහාය වන කමිටු වර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී භාවිත වන "මිළ සැසඳුම් ක්‍රමය (shopping method)" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රසම්පාදන දැන්වීමක ඇතුළත් විය යුතු මූලික කරුණු සඳහන් කරන්න. (ලකුණු 12)

4.(i) හානි සම්බන්ධයෙන් "අත්හැර දැමීමේ නියෝගය" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 04)

(ii) මු.රෙ.102 යටතට ඇතුළත් නොවන අලාභ හානි මොනවාද? (ලකුණු 04)

(iii) මු.රෙ.105 ප්‍රකාරව අලාභ හානි සම්බන්ධයෙන් අයකර ගත හැකි උපරිම අගය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

5.කෙටි සටහන් ලියන්න.

(i) සාමූහික ප්‍රතිපාදන

(ii) හරස් සටහන්

(iii) දෙපාර්තමේන්තු ප්‍රධානියා

(iv) ලංසු ඇපකරය (ලකුණු 05 x 4=20යි)

www.psc.wp.gov.lk